## කෘෂිකර්මාන්තයට ඇති වාසි

අද ලංකාවේ කෘෂිකර්මාන්තයේ සාර්ථක අස්වැන්නක් ලබා ගැනීමට ඇති ප්‍රධාන ගැටළුවක් ලෙස පසේ අඩු සාරවත් බව සැලකිය හැකිය. මෙයට ප්‍රධාන හේතුව වී ඇත්තේ පසේ අන්තර්ගත අඩු කාබනික ද්‍රව්‍ය ප්‍රමාණයයි. මේ සඳහා කළයුත්තේ පසට කාබනික ද්‍රව්‍ය එක් කිරීමයි. කෙසේ නමුත් අද එලෙස යෙදිය හැකි සුදුසු කාබනික පොහොර වර්ග හා ප්‍රමාණ සීමාසහිත වන අතර මිලද සැලකිය යුතු ලෙස අධික වේ. මේ නිසා සුලභව දක්නට ලැබෙන බ්‍රොයිලර් අපද්‍රව්‍ය මගින් කොම්පෝස්ට් නිෂ්පාදනය කර කාබනික පොහොරක් ලෙස භාවිතා කිරීම පසේ සාරවත් බව වැඩි කිරීමට හේතු වේ. එය භෝග වගාවේ සාර්ථකත්වයට හා පසේ දිගුකාලීන සාරවත් බව ආරක්ෂා කර ගැනීමට ද උපකාරී වේ.

**කොම්පෝස්ට් නිපදවීමේදී දිරාපත් වීම ඉක්මන් කිරීමට ගතයුතු ක්‍රියා මාර්ග**

- ගව මුත්‍ර හෝ ගව මඩුවල ආස්තරණ එකතු කරන්න
- සත්ව පොහොර යොදන්න
- අමු හා ළපටි ශාක පත්‍ර එකතු කරන්න
- යූරියා ස්වල්පයක් යොදන්න
- සැකසූ කොම්පෝස්ට් ස්වල්පයක් එකතු කරන්න
- රනිල ශාක පත්‍ර එකතු කරන්න

**කාබනික පොහොර යෙදීමේ වාසි**

- පසේ පූර්ණ සාරවත් බව වැඩි කරයි
- පසේ භෞතික රසායනික හා ජීව විද්‍යාත්මක ලක්ෂණ වැඩි දියුණු කරයි
- පසේ ආම්ලිකබව අඩු කරයි
- ශාක වර්ධනයට අවශ්‍ය සියළුම පෝෂ්‍ය පදාර්ථ පසට ලබාදේ
- පසේ දිගුකාලීන සාර්ථක බව වැඩි කරයි
- පාංශු ගැටළු අවම කරයි
- පසේ සෝදා පාළුව අවම කරයි
- වගාවල ආර්ථික වාසිය වැඩි කරයි
- භෝග අස්වැන්න වැඩි කරයි


2008

**සැකසුම:**
ආචාර්ය ජේ.ඩී. හේමන්ත විජේවර්ධන,
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ)
ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය,
මාකඳුර, ගෝනවිල (වයඹ)

දුරකථන අංක 031-2299625
031-2299805

ෆැක්ස් 031-2299707

ඊ මේල් Wijehema@yahoo.com



කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශයේ කාබනික පොහොර නිෂ්පාදනය සහ භාවිතය දිරි ගැන්වීමේ වැඩසටහන අනුග්‍රහයෙනි.

Designed by: AUDIO VISUAL CENTRE, Department of Agriculture, Peradeniya.
Printed by: AGRICULTURE PRESS, Peradeniya.


"අපි වවමු - රට නඟමු"

### කොම්පෝස්ට් නිෂ්පාදනය - 9

# බ්‍රොයිලර් අපද්‍රව්‍ය මඟින් කොම්පෝස්ට් නිෂ්පාදනය



කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි

බ්‍රොයිලර් අපද්‍රව්‍ය යනු බ්‍රොයිලර් කුකුල් කූඩුවලින් ඉවත් කරනු ලබන අපද්‍රව්‍ය සහිත ආස්තරණය වේ. බොහෝවිට මෙම ආස්තරණය ලෙස දහයියා හෝ ලී කුඩු භාවිතා කරනු ලැබේ. බ්‍රොයිලර් අපද්‍රව්‍යවල දහයියා හෝ ලී කුඩු, කුකුළන්ගේ අපද්‍රව්‍ය, කුකුල් කෑම වැනි දෑ අන්තර්ගත වේ.

## වැදගත්කම

ලංකාවේ අද සුලභව දැකිය හැකි නමුත් නිසි පරිදි භාවිතයට නොගන්නා අපතේ යන කාබනික ද්‍රව්‍යයක් ලෙස බ්‍රොයිලර් අපද්‍රව්‍ය හැඳින්විය හැකිය. මෙම අපද්‍රව්‍ය දින 40-45 ක් වැනි ඉතා කෙටි කාලයකදී ලබාගත හැකිය. මෙය වැදගත් කාබනික පොහොරක් ද වේ.

බ්‍රොයිලර් අපද්‍රව්‍යවල සැලකිය යුතු ප්‍රමාණයක් ශාක පෝෂක අන්තර්ගත වේ. මේ නිසා ලංකාවේ කාබනික පොහොර හිඟයට පිළියමක් ලෙස භාවිතා කළ හැකි සාර්ථක කාබනික පොහොරක් ලෙස බ්‍රොයිලර් අපද්‍රව්‍ය සැලකිය හැකිය. මෙම අපද්‍රව්‍ය සාමාන්‍ය ව්‍යවහාරයේ බ්‍රොයිලර් කුකුල් පොහොර ලෙස හඳුන්වනු ලැබේ.

## පෝෂ්‍ය පදාර්ථ

බ්‍රොයිලර් කුකුල් පොහොර භෝග වර්ධනයට අත්‍යාවශ්‍ය ශාක පෝෂක සියල්ලම අන්තර්ගත කාබනික පොහොරකි. විශේෂයෙන්ම වෙනත් කාබනික ද්‍රව්‍ය හා සසඳ බැලීමේදී බ්‍රොයිලර් අපද්‍රව්‍යයේ සැලකිය යුතු පෝෂ්‍ය පදාර්ථ ප්‍රමාණයක් අන්තර්ගත වේ. මේ නිසා බ්‍රොයිලර් ආස්තරණය අපතේ නොයවා කාබනික පොහොරක් ලෙස භාවිතා කිරීම වැදගත්ය.

## විවිධ කාබනික පොහොරවල අන්තර්ගත මූලික පෝෂ්‍ය පදාර්ථ

| කාබනික පොහොර | පෝෂ්‍ය පදාර්ථ ප්‍රමාණය (%) | | |
|---|---|---|---|
| | නයිට්‍රජන් | පොස්පරස් | පොටෑසියම් |
| ගොම | 1.4 | 0.7 | 0.9 |
| ලේයර් කුකුල් පොහොර | 3.0 | 1.5 | 2.4 |
| බ්‍රොයිලර් කුකුල් පොහොර | 2.6 | 1.2 | 1.5 |
| පිදුරු | 0.6 | 0.2 | 1.4 |
| ග්ලිරිසීඩියා | 4.6 | 0.2 | 2.2 |

## ගැටළු

බ්‍රොයිලර් අපද්‍රව්‍ය පොහොරක් ලෙස ඒ ආකාරයෙන්ම භාවිතා කිරීමට ගොවීහු මැලි බවක් දක්වයි. එයට ප්‍රධාන හේතුව වී ඇත්තේ එහි අන්තර්ගත දිරාපත් නොවූ දහයියා නිසාය. මේ නිසා බ්‍රොයිලර් අපද්‍රව්‍ය පොහොර ලෙස භාවිතා කිරීමට ප්‍රථම එය දිරාපත් කිරීමෙන් මෙම ගැටළු විසඳ ගත හැකිය. එයට කළ හැකි සාර්ථකම ප්‍රතිකර්මය බ්‍රොයිලර් ආස්තරණය භාවිතා කර කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීම වේ. මෙමගින් බ්‍රොයිලර් අපද්‍රව්‍ය භෝග වගාව සඳහා සාර්ථක කාබනික පොහොරක් ලෙස හා පස සරු කර ගැනීමේ සම්පතක් වශයෙන් භාවිතා කළ හැකි වේ.

## සැලකිය යුතු කරුණු

බ්‍රොයිලර් ආස්තරණයේ ඇති අධික කාබන් හා නයිට්‍රජන් අතර අනුපාතය දිරාපත්වීමේ ක්‍රියාවලිය පමා කෙරේ. මේ නිසා බ්‍රොයිලර් අපද්‍රව්‍ය මගින් කොම්පෝස්ට් නිපදවීමේදී කාබන් හා නයිට්‍රජන් අතර අනුපාතය අඩුකර ගැනීමට ක්‍රියාමාර්ග ගැනීම කාර්යක්ෂම කොම්පෝස්ට් නිපදවීමට හේතුවේ.

මේ සඳහා ප්‍රදේශයේ හෝ ගෙවත්තේ සොයා ගත හැකි ශාකවල අමු කොළ හෝ අමු තණ කොළ රොඩු භාවිතා කිරීම, වෙනත් සත්ව පොහොර භාවිතා කිරීම, යූරියා ස්වල්පයක් එක් කිරීම, තම ගෙවත්තේ හෝ ප්‍රදේශයේ ගවයින් ඇත්නම් ගව මුත්‍රා හෝ ගව ආස්තරණය භාවිතා කිරීම වැනි ක්‍රම කොම්පෝස්ට් නිපදවීමේදී අනුගමනය කළ හැකිය.

## විශේෂත්වය

බ්‍රොයිලර් අපද්‍රව්‍ය බොහෝදුරට ඒකාකාරී සංයුතියකින් යුක්තය. මේ නිසා බ්‍රොයිලර් අපද්‍රව්‍ය භාවිතා කර නිපදවන කොම්පෝස්ට්වල සංයුතිය බොහෝදුරට ඒකාකාරීව පවත්වා ගැනීමට පහසු වේ. මෙය විශේෂයෙන් වාණිජ කොම්පෝස්ට් නිෂ්පාදනයේ වැදගත් ලක්ෂණයකි.

එසේම මෙම ආස්තරණයේ නගරබද කුණු කසලවල මෙන් පොලිතීන්, වීදුරු, ලී, යකඩ හා බෙලෙක් කැබලි වැනි අපද්‍රව්‍ය අන්තර්ගත නොවේ. බ්‍රොයිලර් ආස්තරණයේ දක්නට ලැබෙන අපද්‍රව්‍ය කුඩා කැබලි ලෙස තිබීම නිසා කැබලි කිරීමේ අවශ්‍යතාවයක්ද පැන නොනගී. මේ නිසා බ්‍රොයිලර් ආස්තරණය පහසුවෙන් හා ලාභදායීව කොම්පෝස්ට් නිපදවීමට භාවිතා කළ හැකිය.

බ්‍රොයිලර් අපද්‍රව්‍ය ක්ෂුද්‍ර ජීවීන් සැලකිය යුතු ප්‍රමාණයක් අන්තර් ගතවන මාධ්‍යයකි. එයට හේතුව දින 40 සිට 45 දක්වා කුකුලන්ගේ අපද්‍රව්‍ය, ආහාර අවශේෂ ආදිය දහයියා සමග එකතු වීමයි. එහි අන්තර්ගත ක්ෂුද්‍ර ජීවීන්ගේ ක්‍රියාකාරීත්වය නිසා කොම්පෝස්ට් නිෂ්පාදනයේදී අමුද්‍රව්‍ය පහසුවෙන් දිරාපත්වීමට ද හැකියාවක් ඇත.

## බ්‍රොයිලර් කර්මාන්තයට ඇති වාසි

බ්‍රොයිලර් අපද්‍රව්‍ය නිසි පරිදි කළමනාකරණය කර ගත නොහැකිවීම වර්තමානයේ එම කර්මාන්තයේ යෙදී සිටින්නන් මුහුණ පා ඇති ප්‍රධාන ගැටළුවකි. මේ හේතුව නිසා පාරිසරික ගැටළු පවා ඇති වී ඇත. බ්‍රොයිලර් අපද්‍රව්‍ය විවිධ ස්ථානවල දැමීමෙන් පරිසරය හා ජලය අපවිත්‍රවීම් බොහෝවිට වාර්තා වී ඇත.

බ්‍රොයිලර් අපද්‍රව්‍ය නිසි පරිදි කළමනාකරණය නොකිරීමෙන් කුකුල් පාලනයේ "ගම්බෝරෝ" වැනි රෝග පැතිරීම නිසා ද ගැටළු ඇති වී ඇත. මෙම රෝග පාලනය කිරීමට අධික ලෙස මුදල් වැය කිරීමට සිදුවන අතර ඒ නිසා බොහෝ කුකුල් කොටු පාඩුදායක තත්වයකට පවා පත්වී ඇත. කෙසේ නමුත් බ්‍රොයිලර් අපද්‍රව්‍ය මගින් කොම්පෝස්ට් නිපදවීමේදී ඇතිවන අධික උෂ්ණත්වය නිසා බොහෝ රෝගකාරකයින් විනාශවීම සිදු වේ. මේ නිසා කුකුල් කර්මාන්තයේ විවිධ රෝග අවම කර ගැනීමට පවා බ්‍රොයිලර් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය හේතුවේ.

බොහෝ බ්‍රොයිලර් කර්මාන්තකරුවන්හට තම අපද්‍රව්‍යය බැහැර කර ගැනීම පිළිබඳව ගැටළු මතු වී ඇත. එබැවින් මෙම අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කර කොම්පෝස්ට් පොහොර නිපදවා ගැනීම තුළින් අතිරේක ආදායම් මාර්ගයක් ඇති කර ගැනීමටද හැකිවේ.



කොම්පෝස්ට් යෙදූ මාළු මිරිස් වගාවක්